# ලාංකේය ගෘහ සැලසුම්කරණය කෙරෙහි වාස්තුශාස්ත්‍රීය සිද්ධාන්තයන්හි බලපෑම

# The Influence Of Vastusastra Principles On Sri Lankan House Planning

*Ven. Udawela Rewatha Thero*

## Abstract

*Västuçästra* is considered as the traditional Indian system of house building. *Västuçästra* theories developed systematically through two schools, north and south, have been created taking into account the variations of the five elements. Västuçästra sources cover everything from choosing a plot of land to building a house to designing a roof. The *Västuçästra* theories have had an impact on Sri Lankan house planning. The migrations and invasions that took place from the vijayävataraëaya onwards also had a profound effect on the construction industry in Ceylon. Current practices of architecture are riddled with misconceptions. Therefore, it was hoped to study the basic theories in relation to *Västuçästra* source. This research was conducted under the Literary Source Analysis Method. The South Indian texts *Mayamataya* and *Mänasära* were also cited as the primary sources, as were the North Indian *Västuçästra* texts *viçvakarmaprakäça* and *aparäjitapåcchä*. The study of Sri Lankan architecture used the Mahävaàça as a source of ancient historical literature as well as archaeological information. The ancient work that was known as *Puraamayimata* written in Sri Lanka also was examined. Important information related to the research was also reviewed by conducting interviews with traditional carpenters and masons. This study revealed that many architectural consultants today do not have a good understanding of the basic principles. As a result, it became clear that falsehoods were being socialized. In this research, it was possible to correct errors on the basis of the correct source and reveal formal theories. It was also revealed that Indian västuçästra theories have had a profound effect on Sri Lankan architecture since ancient times.

***Key words :*** *Architecture, House Planning, Influence, Västuçästra*

JOURNAL OF THE FACULTY OF HUMANITIES -29

## 1. හැඳින්වීම

සංස්කෘත ශබ්ද කෝෂයෙහි වාස්තු යන්න අර්ථ කථනය කර ඇත්තේ වාසස්ථානය යනාර්ථයෙනි. **වාස්තු** යන පදය **වාස් (නිවාසේ)** ධාතුවෙන් නිපන් වාසය කිරීම යනාර්ථය දෙන පදයකි.[31] මෙහි ප්‍රාණීන් හෙවත් මිනිසුන් වාසය කරන්නේ ය යනාර්ථයෙන් වාස්තු නම් වන බව **වසන්ති ප්‍රාණිනඃ යත්‍ර තත් වාස්තු** යන නිර්වචනයෙන් පැහැදිලි වේ. වාස්තු යනු පුරුෂ ලිංග හා නපුංසක ලිංග යන ලිංගද්වයෙහි ම වර නැගෙන ද්විලිංගික වචනයකි.[32] වාස්තු යන වචනයෙන් ගෙවත්ත, ඉඩම, ගෙබිම, ගෙදර, වසන තැන අර්ථවත් වන බව අලගියවන්න සංස්කෘත සිංහල ශබ්දකෝෂයෙහි විවරණය වේ.[33] වත්ථුවිජ්ජා යනු පාලි භාෂාවෙහි වාස්තුවිද්‍යාව හඳුන්වන ආකාරයයි. ගොඩනැගිලි සෑදීමට යෝග්‍ය තැන් දැනීමේ ශාස්ත්‍රය ඉන් අර්ථවත් වන බව පාලි සිංහල ශබ්දකෝෂයෙහි නිර්වචනය වේ.[34] වත්ථුවිජ්ජා යනු ගෘහය පමණක් නොව ගෙවතු ආරාම හා ඉඩකඩම් ආදියෙහි ගුණ දොස් සලකන විද්‍යාව වන බව දීඝනිකායට්ඨ කථාවෙහි සඳහන් වේ. වත්ථු කම්මං, වත්ථුපරිකම්මං, වත්ථුපරිකිරණං යනුවෙන් වාස්තුවිද්‍යාවට අදාළ පරියාය වචන තුනක් පිළිබඳ ව දීඝ නිකායේ බ්‍රහ්මජාල සූත්‍රයෙහි සඳහන් වේ.[35] ඒ අතර වත්‍ථු කම්ම යනු පොදුවේ වාස්තුවිද්‍යාව හඳුන්වන පාරිභාෂික වචනයයි. අලුත් ගෘහයන් තැනීම ''**වත්‍ථුපරිකම්ම**'' නම් වේ. ''**වත්‍ථුපරිකිරණං**'' යනු භූමින්හි පවත්නා උවදුරු දුරු කිරීමට පිළියම් සිදුකිරීමයි. සමරාංගණ සූත්‍රධාරයෙහි එන ශ්ලෝකයට අනුව වාස්තු යනු ''**වසු**'' යන පදයෙන් සෑදුණු පදයකි. වසු යන්නෙන් පොළව අර්ථවත් කෙරේ.[36] වාස්තු යන වචනයෙන් පොළව මත තනා ඇති සියලු ම ගොඩනැගිලි හඳුන්වන බව සමරාංගණ සූත්‍රධාරයෙහි විවරණයයි. සැබවින් ම භූමිය ම ප්‍රධාන වාස්තුව වේ. **(භූරේව මුඛ්‍යවාස්තු ස්‍යාත් තත්‍ර ච ජාතානයත්‍යානි හි භූතානාමාදි භූතත්වාදාධාරත්වාජ්ජගතිස්ථිතේඃ)**[37] සියලු ම ඉදිකිරීම් සිදු කරනු ලබන්නේ භූමිය මත ය. ඉදිකිරීම්වලට පමණක් නොව සමස්ත ලෝකයට ම ආධාර වී ඇත්තේ ද භූමියයි. ඒ නිසා වාස්තු අතර ප්‍රධාන වාස්තුව වන්නේ භූමියයි. මේ අනුව ගෘහය ඉදි කරනු ලබන භූමිය, ඉදිකිරීමට අවශ්‍ය අමුද්‍රව්‍ය, ඉදි කිරීම් ක්‍රියාවලිය යන සමස්තය පොදුවේ වාස්තු වශයෙන් හඳුන්වන බව පෙනේ.

ශ්‍රී ලංකාවේ වාස්තුවිද්‍යාවේ ආරම්භය ප්‍රාග් - බෞද්ධ යුගයේ සිට ම පැවත එන්නකි. එහෙත් පුරාවිද්‍යාත්මක වශයෙන් ඒවා කිසිවක් තහවුරු වී නොමැත. ඒ නිසා ඒ පිළිබඳ හඳුනාගැනීමට උපකාරී වන්නේ ඓතිහාසික මූලාශ්‍රයන්හි දැක්වෙන තොරතුරු ය.

---

31 අප්පුහාමි, හර්මානිස්, වයි.ඒ., (2008). *වාස්තුවිද්‍යාව හෙවත් ගෘහනිර්මාණ ශිල්පය*, ගුණසේන සහ සමාගම, කොළඹ, ප්‍රස්තාවනාව, iv පිටුව.

32 Williams, Monior, (2005). *Sanskrit -English Dictionary*, Asian Educational Services, New Delhi, ,947-948 pages.

33 අලගියවන්න, පුවසති, (2004). *අලගියවන්න සංස්කෘත සිංහල ශබ්දකෝෂය*, සූරිය ප්‍රකාශන, කොළඹ 10, 715 පිටුව.

34 බුද්ධදත්ත නාහිමි, පොල්වත්තේ, (1998). *පාලි - සිංහල අකාරාදිය*, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල, 430 පිටුව.

35 දීඝනිකාය, *බ්‍රහ්මජාල සූත්‍රය*, බු.ජ. 20 පිටුව.

36 Devi, Vasudev, Gayatri, (2009). *Vāstu*, Motilal Banarshidass Publishers, Delhi, 6 page.

37 Devi, Vasudev, Gayatri, (2009) *Vāstu*, lal Banarshidass Publishers, Delhi, , 27 page

JOURNAL OF THE FACULTY OF HUMANITIES 29

විජය රාජ කාලයෙන් ඔබ්බට ගෘහ කර්මාන්තය පිළිබඳ තොරතුරු ලබාගැනීමට කිසිදු මූලාශ්‍රයක් නැත. ඒ කාලයේ වාසස්ථාන ලෙසට භාවිත කර ඇත්තේ ගල් ගුහාවන් ය. ගෘහනිර්මාණ ශිල්පයෙහි උපත ඒ හරහා ඇතිවූයේ යැයි සිතිය හැකි ය. පූර්ව ඉතිහාස යුගයෙහි හෙවත් ගල් ආයුධ සමයේ ගෘහනිර්මාණයන්ට නිදසුන් වශයෙන් **පදියගම්පොළ, තන්තිරිමලේ ගල්ගුහා** හා **කුවේණිය විසූ ගල් ගුහා** වැදගත් වේ.[38] පෞරාණිකයන් ස්වකීය වාසස්ථාන වශයෙන් ගල්ගුහාවල විසූ බව බෞද්ධ සභ්‍යත්වයෙන් ද හෙළිදරව් වේ. මුල් අවධියේ භික්ෂූන් වහන්සේලාගේ ප්‍රධාන වාසස්ථාන වූයේ ද ගල්ගුහාවන් ය. අනුරාධපුරයේ **වෙස්සගිරිය, මිහින්තලේ ගල්ගුහා, රිටිගල, සිතුල්පව්ව** ආදි ගල්ගුහා මෙහිලා නිදසුන් වේ.[39]

ක්‍රි. පූ. හයවෙනි සියවසේ දී ලංකාවට පැමිණි ආර්යයන් ස්වකීය වාසස්ථාන පිහිටුවා ගනු ලැබුවේ මල්වතු ඔය කේන්ද්‍ර කරගෙන ය. ඔවුන්ගේ වාසස්ථාන සඳහා ඉක්මනින් විනාශ වන ද්‍රව භාවිත කරන්නට ඇතැයි සිතිය හැකි ය. අනුරාධ නම් කුමාරයා - **රාජගේය** - නම් වූ ගොඩනැගිල්ලක් තැනූ බව වංශකථාවන්හි සඳහන් වේ.[40] ක්‍රි. පූ. 543 - 437 කාලයේ දී විජය රජු - **තම්මැන්නා** - නමින් නුවරක් ඉදිකර රාජාභිෂේකයට මධුරා පුරයෙන් ඉන්දියානු කර්මාන්තකරුවන් (අටලොස් කුලයකට අයත්) දහසක් ගෙන්වා ගත් බව මහාවංසයෙහි සඳහන් වේ. ඔවුනතර

1. **ගල් වඩුවන්** 2. **ලෝහ කර්මාන්තකරුවන්** 3. **ලී කැටයම්කරුවන්**
4. **චිත්‍ර ශිල්පීන්** 5. **ගෘහ නිර්මාණ ශිල්පීන්**

යන පස් වැදෑරුම් කලාකරුවන් සිටින්නට ඇතැයි විශ්වාස කළ හැකි ය. විජයාවතරණය කළ අවධියේ යක්ෂ, නාගාදි ගෝත්‍රයන් විසූ - **ලංකාපුර** - නමින් හැඳින්වෙන නගරයක් ගැන සඳහන් වේ. විජය රජු හා කුවේණිය අතර ඇතිවූ අර්බුදයේ දී ඇය තම දරු දෙදෙනා පිට නුවර හිඳුවා, ඇය පමණක් ඇතුලු නුවරට ගිය බව මහාවංසයේ එන විස්තරයයි.[41] පිට නුවර හා ඇතුල් නුවර යනු පසුකාලීන ව සංවර්ධනය වූ නගරයන්හි ප්‍රධාන අංගද්වයකි.

මහාවංසයේ විස්තරයනට අනුව විජය රජුගේ ඇමතියකු වූ අනුරාධ නම් කුමාරයා විසින් - **අනුරාධ ගාම** - නමින් ගමක් ගොඩ නගා තිබේ.[42] විජයගෙන් පසු පණ්ඩුවාස දේව රජ දවස ඔහුගේ මස්සිනා වූ අනුරාධ නම් කුමාරයෙක් එහි ම ජනපදයක් ද ඇති කර ඇත. පණ්ඩුකාභය කුමරු රජ වීමෙන් ස්වකීය රාජධානිය ස්ථාපිත කළේ ද මේ භූමියෙහි ම ය.

විජය කුමාරයා ලංකාවට ගොඩ බට ස්ථානයෙහි තම්බපන්නී නුවර ඉදිකර ඇත. පණ්ඩුවාසදේවගේ මෙහෙසිය වූ භද්දකච්චානාගේ සහෝදර ශාක්‍ය කුමාරවරු 06 දෙනෙක් ලංකාවට පැමිණ ඇත. **උපතිස්සගාම, උජ්ජෙනී, උරුවෙලා, විජිතගාම** හා **රෝහණගාම** පිහිටවන ලද්දේ ඔවුන් විසිනි.[43]

JOURNAL OF THE FACULTY OF HUMANITIES 29

---

38 වික්‍රමසිංහ, එස්. ඒ., (1962). *හෙළ කලා ඉතිහාසය.* මහනුවර එක්සත් මුද්‍රණාලය. මහනුවර.20 පිටුව.
39 වික්‍රමසිංහ, එස්. ඒ., (1962). හෙළ කලා ඉතිහාසය. මහනුවර එක්සත් මුද්‍රණාලය. මහනුවර. 20 පිටුව.
40 මහාවංශය, 7 පරිච්ඡේදය. 57 ගාථාව.
41 මහාවංශය,
42 අමරසිංහ, මාලිංග, (2009 ). *පුරාණ රජමාලිගා.* දයාවංශ ජයකොඩි සහ සමාගම. මරදාන. 10 පිටුව
43 අමරසිංහ, මාලිංග, (2009). පුරාණ රජමාලිගා. දයාවංශ ජයකොඩි සහ සමාගම. මරදාන. 11 පිටුව

මේ අනුව ලාංකේය ගෘහ සැලසුම්කරණයෙහි ක්‍රමාභිවෘද්ධියට භාරතීය ආභාසය ලැබී ඇති බව පෙනේ. විජය රජු, පණ්ඩුවාසදේව, භද්දකච්චයනාගේ සහෝදරවරු සියලු දෙන ම භාරතීයයෝ වූහ. එපමණක් නොව මධුරා පුරයෙන් පැමිණි අටළොස් කුලයක ශිල්පකරුවෝ ද සියලුදෙනා ම පාහේ භාරතීයයෝ වූහ. භාරතීයයන් විසින් ස්වකීය ශිල්පීය ඥානය සඳහා භාවිත කර ඇත්තේ අග්නි/ ස්කන්ධ ආදි පුරාණයන්හි හා පෞරාණික වාස්තුවිද්‍යා ග්‍රන්ථයන්හි භාවිත සිද්ධාන්තයන් ය. ඔවුන්ගේ උපදේශකත්වයෙන් තැනූ ලාංකේය ගෘහ කර්මාන්තයන් ද නගර නිර්මාණයන් ද තනා ඇත්තේ ඔවුන්ගේ එම ශිල්පීය ඥානය උපයෝගී කරගෙන ය. මේ අනුව මුල්කාලයේ සිට ලාංකේය ගෘහ නිර්මාණකරණය සඳහා සංස්කෘත වාස්තුවිද්‍යා සිද්ධාන්තයන්හි බලපෑම ලැබී ඇති බව පෙනේ.

## 2. පර්යේෂණ ගැටලුව

වර්තමානයෙහි වාස්තු උපදේශකයෝ බොහොදෙනෙක් මේ ක්ෂේත්‍රයෙහි ව්‍යාවෘත වෙති. එහෙත් ඒ බොහෝදෙනෙක් සතු ව ඇත්තේ පාරම්පරික දැනුම මිස මූලාශ්‍රයානුගත අවබෝධයක් නොමැත. වාස්තුශාස්ත්‍රීය ග්‍රන්ථ රචනා වී ඇත්තේ සංස්කෘත භාෂා මාධ්‍යයෙනි. යථෝක්ත වාස්තු උපදේශකයෝ සංස්කෘත භාෂාව පිළිබඳ අල්පශ්‍රැතයෝ වෙති. මේ නිසා මූලාශ්‍රය විමසීමට ඔවුන්ට හැකියාවක් නොමැත. ඒ නිසා පාරම්පරික ව හිමි වූ දැනුම යාවත්කාලීන නොකොට නඩත්තු කරමින් ඔවුහු කටයුතු කරති. මේ නිසා වාස්තුශාස්ත්‍රීය ක්ෂේත්‍රය පිළිබඳ වර්තමාන සමාජය තුළ විශ්වසනීයත්ය පලුදු වෙමින් පවතී. තව ද ආර්ථික හා සමාජීය වශයෙන් සේවාදායකයන්ට මුහුණ දීමට සිදු වන ගැටලු ද සුළුපටු නොවේ. එපමණක් නොව විධිමත් ව ප්‍රායෝගික ව නිර්මාණය කර ඇති මේ ක්ෂේත්‍රයෙහි උන්නතියට ද මෙය ප්‍රබල අභියෝගයක් වී ඇත. මේ නිසා ලාංකේය ගෘහ සැලසුම්කරණය කෙරෙහි වාස්තුශාස්ත්‍රීය සිද්ධාන්තයන්හි බලපෑම කවරකාරයෙන් සිදු වී ඇද්දැයි විමසීම මෙම පර්යේෂණයෙහි ගැටලුව වේ.

සැබවින් ම ගෘහයක් තැනීම යනු කලාත්මක වූ විද්‍යාවක් වේ. තත් ක්ෂේත්‍රය විෂයෙහි ප්‍රාමාණික පුෂ්ටිමත් මූලාශ්‍රයන් සංස්කෘත සාහිත්‍ය ඉතිහාසය සතු වේ. ලාංකේය ගෘහනිර්මාණ සැලසුම්කරණය විධිමත් ව ආරම්භ වීම මෙන් ම ක්‍රමාභිවෘද්ධියට පත්වීමෙහිලාත් භාරතීයයන්ගේ නොමඳ ආභාසය ලැබුණි. භාරතීය ගෘහනිර්මාණ සැලසුම්කරණය හැදී වැඩී විකසිත ව පැවතියේ සංස්කෘත මූලාශ්‍රයාගත වාස්තුවිද්‍යාත්මක සිද්ධාන්තාශ්‍රිත ව ය. භාරතීයයන් අතින් ලාංකේය ගෘහනිර්මාණ ශිල්පියා අවශෝෂණය කර ගනු ලැබුවේ ද යථෝක්ත සංස්කෘත මූලාශ්‍රයාගත වාස්තුවිද්‍යාත්මක සිද්ධාන්ත මිස වෙන මූලාශ්‍රයක් නොවේ. මේ නිසා පුරාණ සමයෙහි සිට ලාංකේය ගෘහසැලසුම්කරණ සිද්ධාන්තයන් කෙරෙහි නොමඳ ව බල පා ඇත්තේ සංස්කෘත මූලාශ්‍රයාගත වාස්තුවිද්‍යාත්මක සිද්ධාන්තයන් බව තහවුරු වේ.

## 3. සාහිත්‍ය විමර්ශනය

වාස්තුවිද්‍යාව කවදා ආරම්භ වූයේදැයි නිශ්චිත ව නිගමනය කළ නොහැකි ය. ඈත අතීතයෙහි මිනිසුන් කුමන ආකාරයෙන් ජීවත් වූයේ ද යන්න වටහාගත යුත්තේ ඓතිහාසික මෙන් ම පුරාවිද්‍යාත්මක වූ මූලාශ්‍රයන් පාදක කර ගෙන ය. එහෙත් ඈත අතීතයෙහි ගොඩ නගන ලද ගෘහයක කිසිදු නෂ්ටාවශේෂයක් මෙතෙක් හමු වී නොමැත.

JOURNAL OF THE FACULTY OF HUMANITIES - 29

එහි දී සාහිත්‍යාත්මක වූ මූලාශ්‍රයන් ඔස්සේ තොරතුරු ගවේෂණය කරන්නට සිදු විය. සාහිත්‍යාත්මක වූ මූලාශ්‍රයන් අතර ඍග්වේදය, යජුර්වේදය, සාමවේදය හා අථර්වවේදය ප්‍රාරම්භක සාහිත්‍ය මූලාශ්‍රයන් වශයෙන් පරිශීලනය කරන ලදී. එහි දී වාස්තුවිද්‍යාවෙහි මූලබීජයන්ට අදාළ දත්ත සමූහයක් සොයා ගැනීමට හැකි විය. භාරතයෙහි විකසිත වූ කාව්‍ය, නාටක, මූර්ති, සංගීත මෙන් ම ආගමික, ආර්ථික, දේශපාලනික හා සාමාජික වූ කරුණු ගවේෂණයේ දී ප්‍රාරම්භක මූලාශ්‍රය වන්නේ යථෝක්ත චතුර්වේදයන් ය. ක්‍රමානුකූල ව මිනිසා ගෘහයන් තැනීමට නැඹුරු වූ ආකාරය යථෝක්ත සාහිත්‍ය මූලාශ්‍රයන්හි සඳහන් වේ. එහෙත් ඒ සෑම සාධකයක් ම පාහේ බොහෝ දුරට ඉදිරිපත් වී ඇත්තේ ආගමික සංකල්පාශ්‍රිත ව ය. කෙසේ වෙතත් වීරකාව්‍ය අවධිය වන විට භාරතීය ගෘහනිර්මාණකරණය ඉතා දියුණු අවස්ථාවකට සම්ප්‍රාප්ත ව තිබුණි. මහාභාරත හා රාමායණ යන වසර ගණනක් පුරා සංවර්ධනය වෙමින් පරිපූර්ණ වූ වීරකාව්‍යද්වයෙහි සඳහන් සාධකයන් මගින් ඒ බව මනාව තහවුරු වේ. වේද ග්‍රන්ථ හා වීරකාව්‍ය අතර කාලසමයේ දී විකසිත වූ පුරාණ නම් ග්‍රන්ථයන් ද ප්‍රස්තුතයෙහිලා වැදගත් මූලාශ්‍රයක් වේ. පසුකලීන ව විකසිත වූ බොහෝමයක් වාස්තුවිද්‍යාත්මක ග්‍රන්ථයන්ට මූලාධාර වූ සිද්ධාන්ත මේ පුරාණ ග්‍රන්ථයන් තුළ සටහන් ව ඇත. මීට අමතර ව සූත්‍ර සාහිත්‍යය අතර ද වැදගත් වාස්තුවිද්‍යාත්මක වූ ඉගැන්වීම් පිළිබඳ දත්ත ශේෂ ව ඇත.

වීරකාව්‍ය අවධියේ දී රාවණ රාජධානිය පාදක කර ගෙන ලංකාවේ ද ඉතා දියුණු ගෘහනිර්මාණ සම්ප්‍රදායක් පැවතී ඇත. එහෙත් ඒ පිළිබඳ ව කිසිදු සාධකයක් මෙතෙක් සොයා ගෙන නැත. වීරකාව්‍ය හා පුරාණ ග්‍රන්ථ හැරුණු විට කෞටිල්‍යගේ අර්ථශාස්ත්‍රය ද වැදගත් මූලාශ්‍රයක් වේ. දේශපාලනික, ආර්ථික විෂය කේන්ද්‍රීය අත්පොතක් වශයෙන් ප්‍රකට අර්ථශාස්ත්‍රයෙහි වාස්තුවිද්‍යාත්මක වූ කරුණු රැසක් සංග්‍රහ වේ.

ක්‍රි:පූ: 06වන සියවසේ භාරතයෙහි පහළ වූ ලෝකස්වාමි වූ බුදුරජාණන් වහන්සේ විසින් හඳුන්වා දුන් ආවාස හෙවත් භික්ෂු වාසස්ථාන පිළිබඳ තොරතුරු චුල්ලවග්ග පාළියෙහි මනාව සඳහන් වේ. ඒ හැරුණු විට වාස්තුවිද්‍යාත්මක වැදගත් තොරතුරු ජාතක කථාවන් අතර ද බහුල ව දක්නට ලැබේ.

සංස්කෘත කාව්‍ය සාහිත්‍යය තුළ මහාකාව්‍ය, ගද්‍යකාව්‍ය වැනි කලා මාධ්‍යයන් අතර ද ගෘහනිර්මාණයන් පිළිබඳ ව තොරතුරු සඳහන් වේ. එහෙත් ඒවා කාව්‍යාත්මක වූ වර්ණනා ඔස්සේ ඉදිරිපත් කෙරෙන නිසා ඒවායෙහි සත්‍යතාව පිළිබඳ විමතියක් ඇති වේ.

සංස්කෘත වාස්තුවිද්‍යාත්මක වූ ග්‍රන්ථ රචනා කරන ලද ගුරුකුල සම්ප්‍රදායයන් දෙකක් දක්නට ලැබේ. උත්තර සම්ප්‍රදාය හා දක්ෂිණ සම්ප්‍රදාය යනු තත් සම්ප්‍රදායයද්වයයි. මේ ගුරුකුල සම්ප්‍රදායයන් පාදක කර ගෙන වාස්තුවිද්‍යාත්මක වූ විශාල ග්‍රන්ථ පරම්පරාවක් ද බිහි විය.

ප්‍රාථමික මූලාශ්‍රය ලෙස දක්ෂිණ ගුරුකුල විසින් නිර්මාණය කරන ලද මයමතය හා මානසාරය ද උත්තර ගුරුකුලය විසින් සම්පාදිත විශ්වකර්මප්‍රකාශ හා අපරාජිතපෘච්ඡාව ද භාවිත කෙරිණි. මීට අමතර ව ද්විතීයික මූලාශ්‍රය ලෙස රාම් රාස් (1812) දී පළ කළ *"Essays on the Architecture of Hindus"* කෘතිය ද පරිශීලනය කරන ලදී. එම කෘතිය වාස්තුශාස්ත්‍රය පිළිබඳ පර්යේෂණ මාර්ගය සඳහා මුල් ම අඩිතාලම සකස් කරන ලද විශිෂ්ට කෘතියයි. ඔහුගෙන් පසුව ආචාර්ය පී.කේ. ආචාර්යාගේ දායකත්වය අතිමහත්ය.

JOURNAL OF THE FACULTY OF HUMANITIES 20

භාරතීය ගෘහ නිර්මාණ ශිල්පය පිළිබඳ ශබ්දකෝෂය ප්‍රකාශයට පත් කිරීම ඔහු විසින් මේ විෂයට සිදු කළ අතිමහත් සේවයයි. පී.කේ. ආචාර්ය මහතා (1927-1946) මනසාර පිළිබඳ වෙළුම් ගණනින් යුතු විශිෂ්ට සංස්කරණයක් එළි දක්වන ලදී. එම කාර්යය සඳහා දශක දෙකකට ආසන්න කාලයක් ඔහු කැප කර ඇත. ***Hindu science of architecture*** ලෙස වාස්තුශාස්ත්‍රීය ග්‍රන්ථයක් සම්පාදනය කළ ආචාර්ය (ඩී.එන්.) ශුක්ලා ප්‍රාථමික වාස්තුශාස්ත්‍ර ග්‍රන්ථවල දැක්වෙන පරිදි නිවාස සැලසුම් කිරීමේ මූලධර්ම සහ ක්‍රම විවේචනාත්මක ව විශ්ලේෂණය කළේය. ඉන්දියාවේ නිවාස සැලසුම් කිරීමේ පෞරාණිකත්වය සහ ඉන්දියානු නිවාසවල ආරම්භය සහ වර්ධනය පිළිබඳව ද එහි දීර්ඝ ව සාකච්ඡා කර ඇත. බෘනෝ ඩේගන් විසින් (1984) දී ***Mayamatam- A treatise of Housing, Architecture and Iconography*** පිළිබඳ නිබන්ධනය ප්‍රකාශයට පත් කරන ලදී. ආචාර්ය කුමාරස්වාමි, මහාචාර්ය කේ. ආර්. පිෂාරොති මහතා, ඕ.සී. ගන්ගුලි, ස්ටෙලා හා ක්‍රම්රිස්ච් සහ තවත් විද්වතුන් කිහිප දෙනකු මෙම ක්ෂේත්‍රයෙහි සීමාවන් පුළුල් කර ඇත. විභූති චක්‍රබර්ති 1996,) (1998,) (2002), (2005) ශශිකලා ආනන්ද් (1999,) (2000,)  (2002), ජෝස් ජැකොබ් (2004) ආදි තවත් බොහෝ සමකාලීන විද්වතුන් ද වාස්තු ශාස්ත්‍රයේ දියුණුව සඳහා දායක වී ඇත.

වාස්තුශාස්ත්‍රීය සිද්ධාන්ත පිළිබඳ යථෝක්ත ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය භාවිත කළ අතර ලාංකේය ගෘහ සැලසුම්කරණය පිළිබඳ අධ්‍යයනය සඳහා මහාවංශය, ථූපවංශය, බෝධිවංශය ආදි ප්‍රාථමික සාහිත්‍යය මූලාශ්‍රය ද 2008 දී නැවත මුද්‍රණය කරන ලද වයි. ඒ. හර්මානිස් අප්පුහාමි මහතාගේ '' වාස්තුවිද්‍යාව හෙවත් ගෘහනිර්මාණ ශිල්පය'' කෘතිය ද පරිශීලනය කරන ලදී. මීට අමතර ව (1934) ''කේ. ඒ. කුමාරස්වාමි මහතාගේ ඉන්දියාවේ හා ශ්‍රී ලංකාවේ කලා හා ශිල්ප'' යන කෘතිය ද වැදගත් මූලාශ්‍රයක් විය.

ලංකාවෙහි බොහෝ කාලයක සිට වඩුවන් විසින් අත්පොතක් ලෙස භාවිත කරන ලද '' පුරාණ මයිමතය'' නම් කෘතිය ද ආශ්‍රය කරන ලදී. ''ගෙබිම්බල'' නමින් ඇති දැනට මුද්‍රණය වී නොමැති පුස්කොළ පොත ද නිරීක්ෂණය කරන ලදී.

සාහිත්‍යය මූලාශ්‍රයන්ට අමතර ව පාරම්පරික වඩුවන්, පෙදරේරුවන් හා වාස්තු උපදේශකයන් ද හමු වී සම්මුඛ සාකච්ඡා පවත්වා අදාළ තොරතුරු සම්පාදනය කර ගන්නා ලදී.

## 4. පර්යේෂණ ප්‍රතිඵල

මහින්දාගමනයට පූර්ව ව ලංකාවේ පැවති ගෘහනිර්මාණකරණය පිළිබඳ තොරතුරු ශේෂ ව ඇත්තේ අල්ප වශයෙනි. විජයාවතරණයෙන්  ක්‍රමික ව පණ්ඩුකාභය රජදවස දක්වා ලාංකේය ජනාවාසකරණය සංවර්ධනය වූ ආකාරය පිළිබඳ වැදගත් සාක්ෂි මහාවංසයෙහි සඳහන් වේ. එහෙත් දේවානම්පියතිස්ස රජදවස '' **කාලපාසාද**'' පිරිවෙන තැනීම සඳහා භාවිත ක්‍රමශිල්ප ඉතා නොදියුණු තත්ත්වයක පැවතිණ. මේ අනුව මහින්දාගමනයට පූර්ව ව නොදියුණු මෙන් ම අවිධිමත් ගෘහනිර්මාණකරණයක් පැවති බව පෙනේ. කෙසේ වෙතත් මහින්දාගමනය හා ඉන් පසු ව සිදු වන දුමින්දාගමනයත් සමග ලංකාවට භාරතීය ශිල්පශ්‍රේණිවල ශිල්පීහු සම්ප්‍රාප්ත වූහ. ලාංකේය ගෘහනිර්මාණකරණය විධිමත් ලෙස ක්‍රමාභිවෘද්ධියට පත් වූයේ ඔවුන්ගේ ශිල්පීය ඥානය පාදක කර ගෙන ය.

භාරතීය සමාජයෙන් මූලික ඥානය උකහා ගන්නා ලද්දේ වුවත් එම ඥානය දේශීය වූ අනන්‍ය පරිසරයක නවමු ආකාරයකට ව්‍යාප්ත කරන්නට දේශීය ශිල්පීන් සමත්කම් දක්වා ඇති බව ද නොරහසකි. භාරතීය සමාජයෙහි ව්‍යාප්ත ව තිබුණු වාස්තුවිද්‍යාව ඇතුළු සෑම ශිල්පශාස්ත්‍රයක් සඳහා ම බලපෑ ප්‍රධාන මූලාශ්‍රය වූයේ සංස්කෘත ශිල්ප ශාස්ත්‍ර ග්‍රන්ථයන් ය. භාරතීය ශිල්පීය ඥානය හැදී වැඩී විකසිත ව තිබුණේ සංස්කෘත ශිල්පීය සිද්ධාන්තයන් ඔස්සේ ය. මහින්දාගමනය, දුමින්දාගමනය තුළින් ලංකාවට සම්ප්‍රාප්ත වූ ශිල්පශ්‍රේණි සතු වූයේ ද යථෝක්ත සංස්කෘත ශිල්පශාස්ත්‍ර කේන්ද්‍ර කර ගත් තාක්ෂණික ඥානයයි.

මහින්දාගමනයට පූර්ව ව සිදු වූ විජයාවතරණයෙන් පසු ව අනුරාධ, උරුවේල, විජිත ආදි ගම් සංස්කෘතියක් ද ඒ ගම් පදනම් කර ගෙන ගෘහනිර්මාණ සම්ප්‍රදායක් ද ව්‍යාප්ත විය. අනුරාධ, උරුවේල ආදි ගම් ගොඩනගන ලද්දේ ද විජය සමග පැමිණි භාරතීය සංක්‍රමණිකයන් විසිනි. මේ අනුව ඔවුන් සතු වූයේ ද භාරතයෙහි සෑම ශිල්පශ්‍රේණියක් කෙරෙහි ම නොමඳ ව බල පෑ සංස්කෘත මූලාශ්‍රයාගත සිද්ධාන්තයන් ම බව පැහැදිලි වේ. මේ අනුව ලාංකේය සමාජයෙහි ආදියෙහි පටන් ම ගෘහනිර්මාණ සැලසුම්කරණය සඳහා සංස්කෘත මූලාශ්‍රයාගත වාස්තුවිද්‍යාත්මක සිද්ධාන්තයන්ගේ බලපෑම තිබුණු බව තහවුරු වේ.

පණ්ඩුකාභය රජු අනුරාධපුර නගරය සැලසුම් කිරීම පිළිබඳ මහාවංසයෙන් හෙළි වන තොරතුරු සියල්ල ම සංස්කෘත මූලාශ්‍රයාගත වාස්තුවිද්‍යාත්මක සිද්ධාන්තයන්ට සාදෘශ්‍ය වීමෙන් මේ වග මනාව තහවුරු වේ. පඬුවස්දෙව් රජු පමණක් නොව පණ්ඩුකාභය රජු ද අනුරාධපුර නගර නිර්මාණයේ දී වාස්තුවිද්‍යාවෙහි හසල ආචාර්යවරුන්ගේ උපදෙස් ලබාගෙන ඇත.[44] අනුරපුර හෙවත් අනුරාධපුරය නමින් ඔහු විසින් ඉදිකරවන ලද පුරය හෙවත් නගරය හැඳින් වේ.

අනුරාධ නම් ඇමතියා මෙහි පළමු ව වාසස්ථානයක් තැනූ නිසා හා අනුර නැකතින් ආරම්භ කළ නිසා මෙම පුරය, **අනුරාධපුර** හෙවත් **අනුරපුර** නමින් හඳුන්වන බව මහාවංසයෙහි සඳහන් වේ.[45] පණ්ඩුකාභය රජු මෙම නගරය සැලසුම් කරන ලද්දේ නක්ෂත්‍රවේදීන්ගේ ද උපදෙස් රැගෙන බව මේ අනුව පැහැදිලි වේ. වාස්තුවිද්‍යාවේ දී ඕනෑම ගෘහ නිර්මාණයක් ඉදිකිරීමට ම අදාළ ක්ෂේත්‍රය හෙවත් ඉදිකිරීම් කරන භූමිය හා එහි අයිතිකරු සලකන්නේ බිරිඳ හා සැමියා වශයෙනි. භූමිය තුළ යම් දෝෂයක් වේ නම් එහි අශුභ විපාක හිමිකරුවාට විඳීමට සිදුවන බව වාස්තු නියමයයි. පණ්ඩුකාභය රජු ද වාස්තු ශාස්ත්‍රඥයන් ලවා භූමි පරීක්ෂා කර, ජන්ම පත්‍රයන් ද පරීක්ෂා කර අනුර නැකතින් නුවර තැනීම අරඹන්නට ඇත. සංස්කෘත වාස්තුවිද්‍යාවෙහි පිළිගත් සම්ප්‍රදාය ද මෙයයි.

නගරාරම්භයේ දී පමණක් නොව නගරය සැලසුම් කිරීමේ දී ද පණ්ඩුකාභය රජු සංස්කෘත වාස්තුවිද්‍යා සිද්ධාන්තයන් උපයෝගී කරගෙන ඇත. අනුරාධපුරය විධිමත් වූ සංවර්ධිත වූ නගර සැලසුමක් සහිත නගරයක් විය. මේ විධිමත් බව ඇති කිරීමෙහි ලා බෙහෙවින් බලපා ඇත්තේ සංස්කෘත වාස්තුවිද්‍යා සිද්ධාන්තයන් ය. අනුරාධපුර නගරයෙහි රජ මාලිගාව, ආගමික මධ්‍යස්ථාන, උද්‍යාන, ආරක්ෂක දොරටු, වීථි, මං මාවත්, පොදු සුසාන භූමියක්, වධකස්ථානයක්, සූතිකාගාරයක්, ආරෝග්‍ය ශාලාවක්, සිවිකා ශාලාවක්,

JOURNAL OF THE FACULTY OF HUMANITIES

44 මහාවංශය, 10 පරිච්ඡේදය. 75 ගාථාව
45 මහාවංශය, 10 පරිච්ඡේදය. 76 ගාථාව

සොත්ථි ශාලාවක් ආදි වශයෙන් සෑම නගරෝපාංගයක් ම තිබූ බව මහාවංසයෙහි සඳහන් වේ.[46] මේ නාගරික අංගයන් සංස්කෘත වාස්තුවිද්‍යාත්මක නගර සැලසුමක ද අනිවාර්ය අංගයෝ වෙති. එපමණක් නොව ඒ ඒ අංග වාස්තුවිද්‍යානුකූල ව ඉදි කළ යුතු දිශාවන් ද වේ. අනුරාධපුරය ඒ සිද්ධාන්තානුකූල ව ඒ ඒ නාගරික අංග සුදුසු ස්ථානයන්හි දිශාගත කර ඇති බව පෙනේ.

ඒ අනුව පුරසෝධක චණ්ඩාල, කසලසෝධක, මිනී ඉවත් කරන, සුසාන ගෝපක යන අය සුසාන භූමියෙන් වයඹ/ නිරිත දිග ගමක ද ඒ චණ්ඩාල ගමට ඊසාන දිගින් ඔවුන්ගේ සුසාන භූමිය ද ඒ සුසාන භූමියට උතුරින් වැදි නිවාසය පිහිටවා ඇත. ඒ වැදි නිවාසයන්ට උතුරින් ගාමණි වැව දක්වා තාපසාරාම තනා ඇත. සුසාන භූමියට නැගෙනහිර දිශාවේ ජෝතිය නම් නිගණ්ඨයාගේ ගෘහය ද ගිරි නිගණ්ඨ හා නොයෙක් පාසණ්ඩිකයන්ගේ වාසස්ථාන ද ජෝතියගේ ගෙයට උතුරින්, ගාමිණී වැවට දකුණින් පරිබ්‍රාජකාරාමයක් ද තනා ඇත. සිවිකා හා සොත්ථි ශාලාවක් ද රජු විසින් කරවා ඇත.[47] සිවිකා යනු ශිවලිංගය තබන තැනක් හෝ සූතිකාගාරයක් විය හැකි අතර සොත්ථි යනු බ්‍රාහ්මණයන්ගේ පහසුව පිණිස තැනූ ගෘහයක් හෝ ආරෝග්‍ය ශාලාවක් හෝ විය හැකි බවට විශ්වාස කෙරේ.

ඇතුළු නුවර හා පිට නුවර වශයෙන් විධිමත් ලෙස අනුරාධපුර නගරය සැලසුම් කර ඇති බව පෙනේ. මහාවංශ ටීකාවට අනුව මෙම හැඳින්වීම ඉළනාග (ක්‍රිඃවඃ 33 - 43) කාලයේ සිට පැවතී ඇත. එහෙත් සීහලවත්ථුප්පකරණයෙහි කම්බලගහිතවත්ථුවෙහි සඳහන් වීමෙන් ඊටත් පෙර ඉතිහාසයකට මෙම බෙදීම අයත් වන බව පෙනේ. ශ්‍රී මේඝවර්ණ (ක්‍රි ඃ වඃ 301 - 328) රජ දවස ද ඇතුළු නුවර හා එහි වූ රජමාලිගාව පිළිබඳ ව සඳහන් වේ. මේ රජුගේ සමයෙන් ශතවර්ෂයකට පමණ පසු පැමිණි පාහියන් හිමියන්ගේ දේශාටන වාර්තාවල ද ඇතුළු නුවර හා පිට නුවර පිළිබඳ තොරතුරු අන්තර්ගත වේ. අනුරාධපුරය දර්ශනීය නගරයක් බවට දියුණු වූයේ මුටසීව රාජ්‍ය සමයේ දී ය.

ඇතුළු නුවරින් ඈත් වූ මහා මේඝවනය ගොඩනංවන ලද්දේ ද මුටසීව රජු විසිනි. නගරයෙහි හතර කොනෙහි දොරටු සතරක් තිබී ඇත. ඒ අතර මඟුල් දොරටුව වශයෙන් සලකන ලද්දේ නැගෙනහිර දොරටුව ය. නගරයට පිසෙන ප්‍රධාන දොරටුව වශයෙන් භාවිත කරන ලද්දේ ද මේ දොරටුවයි.

මිහිඳු මාහිමියන් පළමු ව නගරයට ප්‍රවේශ වූයේ ද මේ දොරටුවෙනි. පඨම චේතිය නමින් දාගැබක් මේ දොරටුව අසල ඉදි කර ඇත්තේ ද ඒ බව සිහි කිරීමට ය. ක්‍රිඃ වඃ 935 ට පමණ අයත් ටැම් ලිපියක ආධාරයෙන් නැගෙනහිර දොරටුව පිහිටි තැන සොයාගෙන ඇත. සිරිමෙවන් රජු ''සොත්ථියාකරය'' ගොඩ නගා ඇත්තේ ද නැගෙනහිර දොරටුව අසල ය. ලංකාවේ වෙනත් බොහෝ නිර්මාණයන්ට මෙන් ම ගෘහනිර්මාණයට ද භාරතයෙහි විකසිත ව තිබූ වාස්තු සිද්ධාන්තයන් ගුරු වූ බව පෙනේ. සෑම ගොඩනැගිල්ලක ම දොරටුව නැගෙනහිරට තැබීම හත්වන ශතවර්ෂයෙහි භාරතයේ ද පැවතිණි. නගරයකට සේ ම ගෘහයකට ද ප්‍රධාන ප්‍රවේශය නැගෙනහිර දිශාවෙන් තැබීම සංස්කෘත වාස්තු සිද්ධාන්තයකි. බටහිර දොරටුව පිහිටි දිශාවෙන් කිසිදු ආගමික ගොඩනැගිල්ලක් පිළිබඳ ව සඳහන් නොවේ. බටහිර දිශාවෙහි සුසාන භූමිය පිහිටා තිබීම මීට හේතුවන්නට ඇති බව පුරාතත්ත්වඥයන්ගේ අදහසයි.

---

[46] මහාවංශය, 9 පරිච්ඡේදය. 35 ගාථාව

[47] මහාවංශය, 9 පරිච්ඡේදය. 38 ගාථාව

ඊශාන දිශාවෙහි ආගමික මධ්‍යස්ථාන ඉදිකර ඇත. පූජ්‍යස්ථානය ඊශාන දිශාවෙහි තැනිය යුතු බව සංස්කෘත වාස්තු නිර්දේශය වේ. මහාවංසයෙහි 11 පරිච්ඡේදයෙහි 47 පද්‍යයෙහි චතුශ්ශාලාවක් පිළිබඳ සඳහන් වේ.[48] මෙය මිනිසුන් වාසය කළ ගොඩනැගිල්ලක් නොව දන්හලක් වශයෙන් භාවිත කළ බවට විශ්වාස කෙරේ. කෙසේ වෙතත් සිවු දිශාවට ම ආලින්ද සහිත ව තනන මෙම චතුශ්ශාලා සංස්කෘත වාස්තුවිද්‍යාවෙහි සර්වතෝභද්‍ර, නන්ද්‍යාවර්ත, වර්ධමාන, ස්වස්තික හා රුචක වශයෙන් පඤ්චවිධ වේ.[49] මේ චතුශ්ශාලාවන්හි ආභාසයෙන් යථෝක්ත චතුශ්ශාලාව තනන්නට ඇත.

සංඝමිත්තා මහරහත් තෙරණිය ඇතුළු භික්ෂුණීන් වහන්සේලාට වාසය කිරීම සඳහා දේවානම්පියතිස්ස රජු චූලංග, මහංගණ, සිරිවඩ්ඪ යැයි මන්දිර තුනක් හා අවශේෂ මන්දිර දොළොසක් කරවා ඇත.[50] මේ මන්දිර හෙවත් ප්‍රාසාදයන්හි සැලසුම් කවරාකාර වූයේ දැයි සොයා ගැනීමට තරම් සාධක විරල ය. කෙසේ වෙතත් සංස්කෘත වාස්තුවිද්‍යාවෙහි ප්‍රාසාද වර්ග 20 ක් පිළිබඳ ව සඳහන් වේ. ඒවා අතරින් යථෝක්ත ප්‍රාසාද යම් වර්ගයකට අයත් යැයි සිතීම අසාධාරණ නොවේ.

එපමණක් නොව පොළොන්නරු අවධියේ ඉදි වූ වෛජයන්ත ප්‍රාසාදය, විජයබාහු මාලිගය මෙන් ම පඬුවස්නුවර මාලිගය සඳහා ද සංස්කෘත මූලාශ්‍රයාගත වාස්තුවිද්‍යාත්මක සිද්ධාන්තයන් බෙහෙවින් බලපා ඇත. ඒ සෑම මාලිගයක් ම පූර්වදිශාභිමුඛ ව සැලසුම් කිරීමත් වයඹ දිශාවෙහි වැසිකිළිය හා නිරිත දිශාවෙහි නිදන කාමර සැලසුම් කිරීමත්, ඊශාන හා නැගෙනහිර දිශාවන්හි වැඩි ඉඩක් වෙන් කිරීමත් මෙහිලා නිදසුන් කිහිපයක් පමණක් වේ.

ලෝවමහා ප්‍රාසාදය ඉදිකිරීම පිළිබඳ ව විමසීම ද ප්‍රස්තුතයෙහිලා වැදගත් වේ. මෙය ද ප්‍රාසාදයකි.

මෙය සත්මහල් ගොඩනැගිල්ලක් බව මහාවංසයේ සඳහන් වේ. සංස්කෘත වාස්තුවිද්‍යාවෙහි විස්තර වන ප්‍රාසාද 20 අතරින් ගරුඩ හා නන්දිවර්ධන යන ප්‍රාසාදද්වය ම මහල් සතකින් පරිමිත ඉදිකිරීම් වේ.[51] මේ ප්‍රාසාදද්වයෙහි ම දිග හා පළල රියන් 24 බැගින් වේ. ඒ අනුව මෙය සමචතුරස්‍රාකාර ගොඩනැගිල්ලක් බව පෙනේ. ලෝවමහා ප්‍රාසාදය ද සමචතුරස්‍රාකාර ගොඩනැගිල්ලකි. මෙය වර්ග අඩි $232 \times 231$ ප්‍රමාණයක් සහිත ගොඩනැගිල්ලක් බව සෙනරත් පරණවිතාරණ ශූරින් 1949 දී සිදු කළ කැණීම්වලින් හෙළි වේ. මෙම ආකෘතිය 12 වන සියවසේ දී මහා පරාක්‍රමබාහු රජු විසින් සිදුකළ ප්‍රතිසංස්කරණ ක්‍රියාදාමයට යටත් වූ ආකෘතියේ ශෛලීය රටාව වේ.[52]

ගරුඬ හා නන්දිවර්ධන යන ප්‍රසාදයන්හි දිග හා පළල රියන් සූ විස්සකි. එවිට අඩි වශයෙන් නම් අඩි 48 කි. මේවායෙහි උස රියන් 48 කි.[53] එනම් අඩි 96 කි.

JOURNAL OF THE FACULTY OF HUMANITIES 29

48 මහාවංශය, 11 පරිච්ඡේදය, 47 ගාථාව.

49 අප්පුහාමි, හර්මානිස්, වයි.ඒ., (2008). *වාස්තුවිද්‍යාව හෙවත් ගෘහනිර්මාණ ශිල්පය.* ගුණසේන සහ සමාගම. කොළඹ, 36-38 පිටුව.

50 අමරසිංහ, මාලිංග, (2009). *පුරාණ රජමාලිගා.* දයාවංශ ජයකොඩි සහ සමාගම. මරදාන. 86පිටුව.

51 අප්පුහාමි, හර්මානිස්, වයි.ඒ., (2008). *වාස්තුවිද්‍යාව හෙවත් ගෘහනිර්මාණ ශිල්පය.* ගුණසේන සහ සමාගම. කොළඹ. 293පිටුව.

52 බණ්ඩාර, චිත්‍රකාන්ත, (2009.) *ඓතිහාසික අසිරිමත් පොළොන්නරුව.* ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, මරදාන, 143 පිටුව.

53 අප්පුහාමි, හර්මානිස්, වයි.ඒ., (2008). *වාස්තුවිද්‍යාව හෙවත් ගෘහනිර්මාණ ශිල්පය.* ගුණසේන සහ සමාගම. කොළඹ. 293 පිටුව.

ප්‍රාසාදයෙහි දිග මෙන් දෙගුණයක් එහි උස වන බව පෙනේ. ලෝවමහා ප්‍රාසාදයෙහි ද පරිමාවන් මීට සමාන වේ.

ලෝවාමහා ප්‍රාසාදය ද මෙනමින් හඳුන්වනු ලබන්නේ ලෝහයෙන් කළ ආවරණයක් තිබූ නිසා යැයි පිළිගැනේ. රන්, රිදී, තඹ, ලෝහ ආදි ද්‍රව්‍යයන්ගෙන් තැනූ ගෘහයන් පිළිබඳ ව සංස්කෘත වාස්තු ශාස්ත්‍රයෙහි සඳහන් වේ.[54] මෙම ලෝවාමහා ප්‍රාසාදය තනා ඇත්තේ දෙව්ලොව දේව විමානයට අනුරූපී ව බව මහා වංසයෙහි 27 පරිච්ඡේදයෙහි එන විස්තරයෙන් පැහැදිලි වේ. කාශ්‍යප බුදු හිමියන් දවස අශෝක නම් වූ බ්‍රාහ්මණයෙකුගේ නිවසේ භරණී නම් දාසියක් විය. ඇය මහා සංඝයාට දන් දී මරණින් මතු අලංකාර දේව විමානයක පහළ විය. ඇයගේ රත්න ප්‍රසාදය බලා මහරහතන් වහන්සේලා වස්ත්‍රයක සිතුවම් කර රජුට ගෙනවිත් දුන්හ. රජු ලෝවාමහා ප්‍රාසාදයන් ගොඩනගා ඇත්තේ තත් සැලැස්මට අනුව ය. ගෘහ සැලසුම්කරණය පිළිබඳ ආදිතම අවස්ථාව මෙයයි. මහාවංසයෙහි ලෝවාමහා ප්‍රාසාදය දිගින් හා පළලින් රියන් 100 ක් වූ බවත් නව මහල් වූ බවත් සඳහන් වේ.[55] එහෙත් කලින් කලට විවිධ උවදුරුවලට ලක් වූ මේ ප්‍රාසාදය විවිධ ප්‍රතිසංස්කරණයන්ට නතු වී ඇත. කෙසේ වෙතත් නව මහල් වූ රියන් සියයක් දිග හා පළල වූ මුල් ගොඩනැගිල්ල ද සමචතුරස්‍රාකාර වූවක් බව පෙනේ. ගෘහ සැලසුම් අතර යෝග්‍ය ම ආකෘතිය වන්නේ ද චතුරස්‍රාකාර හැඩයයි. මෙම සිද්ධාන්තය සේ ම, නව මහල් ප්‍රාසාදයෙහි උස රියන් 100 ක් වූයේ යැයි එන විස්තරය ද සංස්කෘත වාස්තුරීත්‍යානුගත වූ අවස්ථාවෝ වෙති. ගෘහයේ උස ගෘහයේ දිගට සමාන ව ම ගත යුතු බව සංස්කෘත වාස්තු නියමයයි.

පුරාණ ලාංකේය සාමාන්‍ය ගෘහයන් පිළිබඳ ව නෂ්ටාවශේෂ කිසිවක් ශේෂ ව නොමැත. පුරාණ ලාංකේය පොදුජන නිවාස පිළිබඳ සාහිත්‍යාත්මක මූලාශ්‍රයාගත සාධක හැරුණු විට වෙනත් කිසිදු සාක්ෂියක් හමු නොවේ. පුරාණ පොදුජන නිවාස සපුරා දිගකල් නොපවතින අමුද්‍රව්‍ය භාවිතයෙන් තනා තිබුණු බව පුරාවිද්‍යාඥයන්ගේ මතය වේ.

බොහෝමයක් ගෘහනිර්මාණ දැවයෙන් හා මැටිවලින් තනා තිබී ඇත. එම අමුද්‍රව්‍ය ඉතා ඉක්මණින් විනාශ වී යෑම ස්වභාවික ය. විශේෂයෙන් රජමාලිගා හා ආගමික ගොඩනැගිලි සඳහා පමණක් කල්පවත්නා ගල්, ගඩොල් වැනි අමුද්‍රව්‍ය භාවිත කර ඇත. එහෙත් ඒ ගොඩනැගිලිවල උපරිභාගයන් ද බොහෝවිට තනා ඇත්තේ දැවවලිනි.

මුල්කාලයෙහි ගල්ගුහාවල දඩයමින් දිවි ගෙවන ලද මිනිසා ඉන් පසු ක්‍රමානුකූල ව ගොවිතැනට නැඹුරු විය. එහි දී ගල්ගුහාවල විසීමෙන් මිදී එළිමහනේ නිවාස තැනීමේ අවශ්‍යතා ව පැන නැගිණි.

ඒ සඳහා ගත් වසර ගණනාවක ප්‍රතිඵලයක් වශයෙන් වරිච්චි නිවාස ක්‍රමය බිහි විය. පුරාණ ලාංකේය සෑම නිවාසයක් ම පාහේ බොහෝ විට වරිච්චි ගසා තනන ලද, දැව බහුල ව භාවිත කළ, පොල් අතු, ඉලුක්, මානා ආදි අතු සෙවිලි කරන ලද නිවාස විය.

---

[54] අප්පුහාමි, හර්මානිස්, වයි.ඒ., (2008). *වාස්තුවිද්‍යාව හෙවත් ගෘහනිර්මාණ ශිල්පය*. ගුණසේන සහ සමාගම. කොළඹ. 47 පිටුව.

[55] වික්‍රමසිංහ, එස්. ඒ., (1962). *හෙළ කලා ඉතිහාසය*. මහනුවර එක්සත් මුද්‍රණාලය. මහනුවර. 22 පිටුව.

එහෙත් ක්‍රමාභිවෘද්ධියට පත්වීමේ දී ගෘහනිර්මාණ සඳහා ගඩොලය නිර්මාණය කර ගන්නා ලදී. මුල්කාලයෙහි භාවිත කරන ලද ගඩොලය නොපුලුස්සන ලදී. රුවැන්වැලි සෑය සඳහා ගඩොල් සකස් කිරීම පිළිබඳ ව ථූපවංශයෙහි මෙන් ම මහාවංශයෙහි ද සඳහන් විස්තරයෙන් ඒ බව පැහැදිලි වේ. ඉන් පසු ව ගඩොලය පුලුස්සා ශක්තිමත් ව සකස් කර ගෙන ඇත. ගඩොල් යොදමින් බිත්ති බැඳීමේ දී මුල්කාලයෙහි ප්‍රධානතම බදාම වූයේ මැටි ය. එහෙත් කල්ගතවීමේ දී මැටි සමග හුනු ද බදාම වශයෙන් භාවිත විය.

ගඩොල් තාක්ෂණයට අමතර ව කළුගල් ද ගෘහනිර්මාණ සඳහා බහුල ව භාවිත කර ඇත. කළුගල් බොහෝ විට ගෘහනිර්මාණයන්හි අත්තිවාරම ශක්තිමත් කිරීම සඳහා භාවිත කර ඇත. දොරටු, ජනේල සඳහා ද ගල් භාවිත කර ඇත. එහෙත් පොදුජන නිවාස සඳහා කළුගල් භාවිත කර නොමැත. පොදුජන නිවාස සඳහා කළුගල් භාවිත කිරීමෙන් වැළකී ඇත්තේ සංස්කෘත වාස්තුවිද්‍යාත්මක වූ සිද්ධාන්ත අනුගමනය කළ නිසා ය. ආගමික හා රජමාලිගා හැරුණු විට සෙසු වාසස්ථාන සඳහා කළුගල් භාවිත කිරීම වාස්තුදෝෂයක් බව සංස්කෘත වාස්තුවිද්‍යා ඉගැන්වීම වේ.

පුරාණ ලාංකේය පොදුජන නිවාස පිළිබඳ තොරතුරු ශේෂ ව ඇත්තේ අත්‍යල්ප වශයෙනි. මීට වසර 150ක් පමණ පැරණි ඉතිහාසයකට අයත් ගෘහනිර්මාණ ලංකාවෙන් සොයා ගත හැකි ය. එහෙත් ඉන් එපිට ඉතිහාසයෙහි වූ ගෘහනිර්මාණ සොයා ගැනීම සුකර නොවේ. වර්තමානයෙහි ශේෂ ව ඇති සිංහල පොදුජන ගෘහනිර්මාණ සෑම එකක් ම පහේ ලන්දේසි, පෘතුගීසි හා ඉංග්‍රීසි යන ජාතිකයන්ගේ ගෘහනිර්මාණ සම්ප්‍රදායයන් සමග සම්මිශ්‍රිත ව වර්ධනය වී ඇති බව පෙනේ. ඊට අමතර ව කලින් කලට විවිධ ප්‍රතිසංස්කරණයන්ට ද බොහෝ පුරාණ ගොඩනැගිලි නතු වී ඇත. මේ සියලු අවහිරතා මැද දනට ශේෂ ව පවතින පුරාණ ගෘහනිර්මාණ සැලසුම් කිහිපයක සිද්ධාන්ත අධ්‍යයනය කරන ලදී. එහි දී ඒ සෑම පුරාණ ගෘහනිර්මාණයක් සඳහා ම සංස්කෘත මූලාශ්‍රයාගත වාස්තුවිද්‍යාත්මක සිද්ධාන්තයන්හි ආභාසය නොමඳ ව ලැබී ඇති බව සුවිශද විය.

රජවරුන් විසින් ස්වකීය සුඛ විහරණය, ආරක්ෂාව හා පාලනය සම්බන්ධයෙන් ගොඩනංවා ගනු ලැබූ නාගරික සංකීර්ණයක ප්‍රධානතම ගෘහ නිර්මාණය රජමාලිගයයි.[56] ලාංකේය රජමාලිගාවල ඉතිහාසය ක්‍රි.පූ. 6 වන සියවසටත් පෙර කාලයකට අයත් වන බව වංශ කථාවන්ගේ හා ජනප්‍රවාදගත තොරතුරුවලින් හෙළි වේ. ආර්යයන් ලංකාවට සංක්‍රමණය වීමෙන් පසුව ස්වකීය වාසස්ථාන ගොඩනගා ගන්නා ලද්දේ ජලාශ්‍රිත ප්‍රදේශවල ය. විශේෂයෙන් මල්වතු ඔය ආශ්‍රිත ප්‍රදේශයන්හි ය. ඉන්පසු ඔවුහු රට අභ්‍යන්තරය තුළට සංක්‍රමණය වූහ. ඒ හරහා ජනාවාස බිහි විය.[57] ජනාවාසකරණයේ මූලිකම අවස්ථාව නම් ග්‍රාම ලක්ෂණ ඇතිවීමයි. ඥාති සම්බන්ධයෙන් බැඳුණු පවුල් කිහිපයකින් පැරණි ඉන්දීය ග්‍රාමයක් නිර්මාණය විය. ලාංකේය සමාජයෙහි ද එසේම ය. එබඳු ගම් කිහිපයක එකතුවකින් නගරය බිහි විය.

JOURNAL OF THE FACULTY OF HUMANITIES 29

56 අමරසිංහ, මාලිංග, (2009). *පුරාණ රජමාලිගා*. දයාවංශ ජයකොඩි සහ සමාගම. මරදාන, 57 පිටුව.
57 අමරසිංහ, මාලිංග, (2009). *පුරාණ රජමාලිගා*. දයාවංශ ජයකොඩි සහ සමාගම. මරදාන, 12 පිටුව.

ක්‍රි: ව: 303ට අයත් ශිලා ලේඛනයක නගරයේ උතුරෙහි වූ ''**කළහුමන**'' නම් නියම් ගමක් පිළිබඳ ව සඳහන් වේ. ප්‍රාචීන දේශයෙහි ''**මහතුබ**'' නම් ගමක් තිබී ඇත. දකුණෙහි හා බටහිර දොරටු අසල ද මෙවැනි ද්වාර ගම් තිබෙන්නට ඇතැයි විශ්වාස කළ හැකි ය. බටහිර දොරටුව අසල ''**සාලිගම**'' පිහිටා තිබිණි. සාලිය කුමරු වශීකරගත් රූමත් අසෝකමාලා විසූ ගම ද මෙය වේ. නගරයට දකුණු දිගින් ''**චේතාවී**'' නම් ගමක් පිහිටා තිබිණි. දුටුගැමුණු ඉදිරියේ පරාජය වී එළාර රජු ජීවිතක්ෂයට පත් ස්ථානයට නැගෙනහිරින් **කුම්භකාර** ගමක් ද වී ඇත. මේ ගම් කේන්ද්‍ර කරගෙන ගෘහනිර්මාණකරණයක් ද තිබෙන්නට ඇත. එසේ ම ක්‍රි.පූ. 500 - 200 ත් අතර කාලයෙහි අබ නගර, අබ නගර, අනුරාධපුර, බම නගර, බතය නගර, චිත නගර, කලහ නගර, නක නගර, නිලය නගර, සිව් නගර ආදි විශාල නගර සමූහයක් තිබූ බව පුරාවිද්‍යාත්මක සාධකවලින් තහවුරු වී ඇත.[58] මීට අමතර ව තම්බපන්නි, විජිත, කලහ, පජ්ජෝත ආදි නගර කිහිපයක් ගැන ද මහාවංසයෙහි සඳහන් වේ.[59] මේ නගර කේන්ද්‍ර කරගෙන නිවාස සංස්කෘතියක් ද ගොඩ නැගී තිබෙන්නට ඇත. එහෙත් ඒ පිළිබඳ ව නෂ්ටාවශේෂ පවා සොයා ගත නොහැකි වී ඇත. මේ සෑම නගරයක් ම චතුරස්‍රාකාර වීම සුවිශේෂ කාරණයකි. ඒ අතර ඍජුකෝණාස්‍ර වූ නගරයන් ද වේ. සමචතුරස්‍රාකාර හෝ ආයත හෙවත් ඍජුකෝණාස්‍රාකාර සැලසුම් ශුභඵලදායක ආකෘතීන් බව සංස්කෘත වාස්තු නියමයයි. ඒ අනුව පෞරාණික ලාංකේය නාගරික සැලසුම්කරණය සඳහා ද සංස්කෘත වාස්තුවිද්‍යාවෙහි බලපෑම ලැබී ඇති බව තහවුරු වේ.

පුරාණ ගෘහ නිර්මාණයන්හි දොර, ජනෙල්, උළුවහු සඳහා බොහෝ විට ඔපමට්ටම් කරන ලද ගල් කුළුණු යොදා ගෙන ඇත. එහෙත් රජමාලිගා, වෙහෙර විහාර, දේවාල හැරුණු විට සෙසු සාමාන්‍ය ගෘහයන් සඳහා ගලින් කරන ලද උළුවහු නොතබන ලදී.

**ද්වරශාඛා නෘපාණාං තු**
**ගෘහෙපාෂාණ නිර්මිතා**
**කර්තව්‍යා නෙත රෙෂාඤ්ච**
**කාරයෙත් මතිමාන්නරඃ** [60] **(විශ්වකර්මප්‍රකාශ)**

යනුවෙන් සංස්කෘත විශ්වකර්මප්‍රකාශ වාස්තුවිද්‍යා ග්‍රන්ථයෙහි සඳහන් සිද්ධාන්තය අනුගමනය කළ නිසා, පුරාණයෙහි සාමාන්‍ය ගෘහයන්හි ද්වාර ශාඛා ගලින් නොකරන ලද්දේ යැයි සිතිය හැකි ය. කෙසේ වෙතත් සාමාන්‍ය ගෘහයන්හි දොර, උළුවහු, ජනෙල් උළුවහු කරන ලද්දේ දැවයෙනි.

ලාංකේය ගෘහනිර්මාණ සම්ප්‍රදායෙහි පැරණි ම ගෘහ රටාව වූයේ මෙම වරිච්චි නිවසයි. මෙම නිවාස සඳහා ඉතා ශක්තිමත් දැව යොදා ගන්නා ලදී. වේයන් හා විවිධ කෘමි සතුන්ගෙන් සිදුවන උපද්‍රවවලින් දැව ආරක්ෂා කර ගැනීමට මෙලෙස ශක්තිමත් දැව යොදාගෙන ඇති බව පෙනේ. විශේෂයෙන් වරිච්චිය සඳහා යොදන ලද මුල් කණු සඳහා මිල්ල, දඹ හෝ වන ඉදල වැනි වෘක්ෂ යොදා ඇත. ගෘහය සඳහා අවශ්‍ය දැව ලබා ගැනීම සඳහා ගස් කපන ලද්දේ අව පැලවිය දවස් ය. ඒ දවස්වලට සඳේ බලය අඩුවන නිසාවෙනි.

---

[58] අමරසිංහ, මාලිංග, (2009). *පුරාණ රජමාලිගා.* දයාවංශ ජයකොඩි සහ සමාගම. මරදාන, 11 පිටුව.
[59] අමරසිංහ, මාලිංග, (2009). *පුරාණ රජමාලිගා.* දයාවංශ ජයකොඩි සහ සමාගම. මරදාන, 12 පිටුව
[60] වික්‍රමසිංහ, එස්. ඒ., (1962). *හෙළ කලා ඉතිහාසය.* මහනුවර එක්සත් මුද්‍රණාලය. මහනුවර, 35 පිටුව.

JOURNAL OF THE FACULTY OF HUMANITIES 2023

කෘෂ්ණපක්ෂේ ඡේදනඤ්ච න ශුක්ලෙ කාරයෙද්බුධඃ [61]

යනුවෙන් සංස්කෘත වාස්තු නිර්දේශය ද කළුවර පක්ෂයෙහි දැව සිඳීම කළ යුතු බවයි. සඳේ ආලෝකය වැඩෙන කාලයෙහි ගස් නොකැපිය යුතුය. ගසේ ආහාර සැරිසැරීම අක්‍රීය වනුයේ සඳ නැති දවසට ය. එවිට ගස සවිමත් ය. ගසේ කෙඳි ද සවිමත් වේ.[62] මේ අනුව පුරාණ ගැමියන් ද යම් ආකාරයකට සංස්කෘත වාස්තු සිද්ධාන්ත පිළිබඳ ව අවබෝධයකින් සිටි බව ඔප්පු වේ.

නූතන ගෘහනිර්මාණ සඳහා භාවිත වන සිද්ධාන්තයන් කෙරෙහි සංස්කෘත වාස්තුවිද්‍යාත්මක වූ සිද්ධාන්තයන්හි නොමඳ බලපෑම දක්නට ලැබේ. ඉඩමක් තෝරා ගැනීම සඳහා, ඉඩමේ පාංශු පරීක්ෂණය සඳහා, දිශා හා බෑවුම නිර්ණය කර ගැනීම සඳහා, ඉඩමේ පිහිටීම, හැඩය නිශ්චය කර ගැනීම සඳහා නූතන ගෘහනිර්මාණ සැලසුම් ශිල්පීන් භාවිත කරනු ලබන්නේ සංස්කෘත මූලාශ්‍රයාගත වාස්තුවිද්‍යාත්මක සිද්ධාන්තයෝ ම වෙති. ප්‍රේත පාදය අත්හැර දමා නිවස සැලසුම් කිරීම එක් නිදසුනක් පමණි. නූතන ශිල්පීහු ගෘහය වටා අඩි 7ක පමණ ඉඩක් ඉඩමේ වැට දක්වා අත්හළ යුතු බව පිළිගනිති. නාගරික සංවර්ධන අධිකාරියෙහි පනවා ඇති නීතිය ද එයයි. තනනු ලබන ගෘහයෙහි ප්‍රමාණය අනුව මෙලෙස වෙන් කරනු ලබන ඉඩ ප්‍රමාණය අධික වේ. ගෘහයක් තනා එහි වාසය කිරීමේ දී පිරිසිදු වාතාශ්‍රය, ආලෝකය අත්‍යවශ්‍ය වේ. නූතනයෙහි නීති මගින් තහවුරු කරනු ලබන මේ සිද්ධාන්තය සංස්කෘත වාස්තුවිද්‍යාවේ ප්‍රේතපාදය වශයෙන් විග්‍රහ කෙරේ.

සැලසුම් ශිල්පියා නිවසක් සැලසුම් කරනු ලබන්නේ ඉඩමේ පිහිටීම සැලකිල්ලට ගනිමිනි. එහි දී ඉඩමට ආසන්න ප්‍රදේශයෙහි පිහිටීම මෙන් ම ඉඩමෙහි හැඩය, බෑවුම යනාදි කරුණු පිළිබඳ ව ද අවධානය යොමු කරනු ලැබේ.

ඉඩමට ආසන්න ව මාර්ගයක් පිහිටා ඇත්නම් නිවස සැලසුම් කළ යුත්තේ මාර්ගයෙහි මධ්‍ය රේඛාවේ සිට මීටර් 15 ක් පමණ දුරිනි.[63] මේ ප්‍රමාණය මහාමාර්ග ආසන්න ඉඩම් සම්බන්ධයෙන් ක්‍රියාත්මක නීතියකි. මහාමාර්ගයක මධ්‍ය රේඛාවේ සිට දෙපසට මීටර් 15 ක භූමි ප්‍රමාණයෙහි නිවසක් නොව කිසිදු ස්ථිර ගොඩනැගිල්ලක් තැනීම නීතිවිරෝධී ක්‍රියාවක් වේ. සාමාන්‍ය මාර්ගයක් ඇත්නම් මීටර් 15 ක් අත්හළ යුතු නොවේ. එහෙත් සාමාන්‍ය දුර ප්‍රමාණයක් අත් හළ යුතු ය.

මීට අමතර ව ගෘහයේ ජනේල, දොරවල් පිහිටි ස්ථානයන් සිට ඉඩමේ මායිම දක්වා අවම වශයෙන් අඩි 7" 6" ක් තිබීම ද අවශ්‍ය වේ. එහෙත් ෆෑන් ලයිට් ඇති ස්ථානවල අඩි 3 ක් ප්‍රමාණවත් වේ. ඉඩමෙහි නිවස සැලසුම් කිරීමේ දී නිවසට ආසන්න ව විදුලි රැහැන් වැටී ඇත්නම් ඒවාට ඇති දුර ප්‍රමාණය ද සැලකිල්ලට ගත යුතු ය. සාමාන්‍ය විදුලි රැහැනක් නම් මීටර් 2 / ½ ක තිරස් දුරක් ද අධිසැර විදුලි රැහැනක් නම් සිරස් ව මීටර් 4 ½ ක් ද තිරස් ව මීටර් 2 ½ ක දුරක් ද තිබිය යුතු වේ.[64]

---

[61] අප්පුහාමි, හර්මානිස්, වයි.ඒ., (2008). *වාස්තුවිද්‍යාව හෙවත් ගෘහනිර්මාණ ශිල්පය.* ගුණසේන සහ සමාගම. කොළඹ, 226 පිටුව.

[62] සිංහලයෝ, 35 පිටුව.

[63] කෝරළෙගේ, දයාරත්න, (2006). *විද්‍යාත්මක පදනමක් මත වාස්තු ශිල්පය.* කර්තෘ ප්‍රකාශන, 135පිටුව.

[64] කෝරළෙගේ, දයාරත්න, (2006). *විද්‍යාත්මක පදනමක් මත වාස්තු ශිල්පය.* කර්තෘ ප්‍රකාශන,138පිටුව.

JOURNAL OF THE FACULTY OF HUMANITIES

එපමණක් නොව ඉඩමේ පිටුපස මායිමේ සිට නිවසේ පිටුපස බිත්තියට තිබිය යුතු සම්මත දුර ප්‍රමාණයක් ද වේ. බිම් මහල පමණක් ඇති නිවසක අඩි 7 ක් හා අඟල් 6 ක (මීටර් 2.75) ප්‍රමාණයක් තිබිය යුතු වේ.[65] මෙම ප්‍රමාණය මහල් ප්‍රමාණය වැඩිවීමේ දී වෙනස් වේ. ඒ අනුව මහල් දෙකක් සහිත නිවසක් නම් අඩි 10 ක ප්‍රමාණයක් ද මහල් දෙකට වඩා වැඩි නම් ගොඩනැගිල්ලේ උස මෙන් අර්ධයක් හෙවත් 50% ක ප්‍රමාණයක් වෙන් කළ යුතු වේ. සැලසුම් ශිල්පියා නිවස සැලසුම් කිරීමේ දී යථෝක්ත කරුණු පිළිබඳ ව සැලකිලිමත් වේ.

ඉඩමේ ගෘහය සැලසුම් කිරීමේ දී පාද බෙදීම ප්‍රධාන සංස්කෘත වාස්තුවිද්‍යා සිද්ධාන්තයකි. නූතනයෙහි භාවිත යථෝක්ත පරිමාවන් වෙන්කිරීමේ ක්‍රමවේදය කෙරෙහි පාද බෙදීම නම් සංස්කෘත සිද්ධාන්තය බලපා ඇති බව කිව හැකි ය. ඉඩමක් ප්‍රධාන වශයෙන් පාද හතරකට බෙදනු ලැබේ. බ්‍රහ්ම පාදය, දේව පාදය, මනුෂ්‍ය පාදය හා ප්‍රේත පාදය යනු ඒවා ය. මින් ප්‍රේත පාදය යනු ඉඩමේ මායිමට ආසන්න භූමිභාගයයි. එහි නිවසේ කිසිදු ඉදිකිරීමක් තැනීමට යෝග්‍ය නොවන බව සංස්කෘත වාස්තුවිද්‍යා නියමයයි. නූතනයෙහි සැලසුම් ශිල්පීන් ද ඉඩමේ මායිමේ සිට නිශ්චිත දුර ප්‍රමාණයක් වෙන් කරනු ලැබේ. මේ අනුව නූතන සැලසුම් ශිල්පීන් ද ඉඩමේ මායිම හෙවත් ප්‍රේත පාදයෙහි නිවාස ඉදිකිරීම අයෝග්‍ය බව පිළිගන්නා බව පෙනේ.

නිවසක දිග - පළල හා උස ද සැලසුම් ශිල්පියා විසින් ස්වකීය සැලසුම් ආකෘතියෙහි දැක්විය යුතු ය. නිවසක දිග හා පළල සෑම විට ම ගණනය කරනු ලබන්නේ ඔත්තේ සංඛ්‍යාවලිනි. ගෘහයක දිග හා පළල සඳහා ඉරට්ටේ සංඛ්‍යාවක පරිමාණයන් යොදා ගනු නොලැබේ. නූතනයෙහි ප්‍රචලිත මේ සිද්ධාන්තය සඳහා ද බලපා ඇත්තේ සංස්කෘත වාස්තුවිද්‍යා සිද්ධාන්තයන් ය. සංස්කෘත වාස්තුවිද්‍යාවෙහි

**දේව බ්‍රාහ්මණයෝර්යුග්මා හස්තසංඛ්‍යාඃ සුපූජිතාඃ**
**අයුග්මසංඛ්‍යාඃ ශේෂාණං ජනයන්ති ගෘහශ්‍රියම්** [66]

යනුවෙන් දේව, බ්‍රාහ්මණ ගෘහ හෙවත් දේවාල, විහාර, පන්සල්වල දිග හා පළල ඉරට්ටේ රියන් ගණනින් ගත යුතු බවත් සෙසු සාමාන්‍ය මිනිසුන්ගේ ගෘහයන්හි දිග - පළල ඔත්තේ සංඛ්‍යාවකින් ගත යුතු බවත් සඳහන් වේ. මේ අනුව නූතන ගෘහනිර්මාණකරණය කෙරෙහි මෙම සිද්ධාන්තය බලපා ඇති බව මොනවට පැහැදිලි වේ.

මීට අමතර ව

**ධ්වජෝ ධූමෝ'ථසිංහශ්වා සෞරභෙයඃ ඛරෝ ගජඃ**
**ධ්වාංක්ෂශ්චෛව ක්‍රමෙණෛතදායාෂ්ටකමුදීරිතම්** [67]

යනුවෙන් ගෘහවර්ග අටක් පිළිබඳ ව සංස්කෘත වාස්තුවිද්‍යාවෙහි සඳහන් වේ. සංස්කෘත වාස්තුවිද්‍යාවෙහි ක්ෂේත්‍රඵල සාධන ක්‍රමවේදයන් යටතේ මේ ගෘහ වර්ග පිළිබඳ ව විස්තර වේ.

[65] කෝරළෙගේ, දයාරත්න, (2006). *විද්‍යාත්මක පදනමක් මත වාස්තු ශිල්පය.* කර්තෘ ප්‍රකාශන, 138පිටුව.
[66] අප්පුහාමි, හර්මානිස්, වයි.ඒ., (2008). *වාස්තුවිද්‍යාව හෙවත් ගෘහනිර්මාණ ශිල්පය.* ගුණසේන සහ සමාගම. කොළඹ, 56 පිටුව.
[67] සෙනෙවිරත්න, ඩී. ආර්., (1997). *වාස්තුරත්නාවලිය.* මොඩන් පොත් සමාගම. නුගේගොඩ, 96පිටුව

JOURNAL OF THE FACULTY OF HUMANITIES, 29

ක්ෂේත්‍රඵලය යනු ගෘහයෙහි දිග හා පළල වැඩි කිරීමෙන් ලැබෙන ඵෙක්‍යයයි. **(විස්තාර ගුණිතං දෛර්ඝ්‍යං ගෘහක්ෂෙත්‍ර ඵලං භවෙත්** [68] එම ඵෙක්‍යය අටින් බෙදූ විට ලැබෙන ශේෂය අනුව ධ්වාජාදි ආය ගණනය කරනු ලැබේ.

මේ අනුව යථෝක්ත ආයයන් අතරින් ශුභ ආයයන් වන්නේ ධ්වජ, සිංහ, වෘෂභ හා ගජ යන ආයයන් පමණි. ඒවාට හිමි අංක වනුයේ 1, 3, 5, 7 යන ඔත්තේ සංඛ්‍යා ය. මේ අනුව මෙම සංස්කෘත වාස්තුවිද්‍යා සිද්ධාන්තයෙහි බලපෑම ද නූතන ගෘහ සැලසුම්කරණය සඳහා බලපා ඇති බව පැහැදිලි වේ.

ගෘහාභ්‍යන්තරය සැලසුම් කිරීම, ප්‍රධාන ද්වාරය තැබීම ආදි කාර්යයන්හි දී ද නූතන ශිල්පීන් අනුගමනය කරනු ලබන්නේ සංස්කෘත වාස්තු සිද්ධාන්තයන් ම ය. නූතනයෙහි දොරටු ඔත්තේ සංඛ්‍යාවකින් ස්ථාපනය කරනු ලැබේ. මේ සිද්ධාන්තය සපුරා සංස්කෘත වාස්තු ඉගැන්වීමක් අනුගමනය කිරීමක් වේ. මීට අමතර ව වර්තමානයෙහි ගෘහයක දිග හා පළල ගණනය කරනු ලබන්නේ ඔත්තේ සංඛ්‍යාවලිනි. එහෙත් එලෙස ඔත්තේ සංඛ්‍යාවකින් ගෘහයෙහි දිග හා පළල ගණනය කරනු ලබන්නේ ද කුමන හේතුවක් නිසා දැයි නූතන ශිල්පීහු නොදනිති. සංස්කෘත වාස්තුවිද්‍යාවේ දී ක්ෂේත්‍රඵල සාධනය යටතේ ධ්වජ, ධූම, සිංහ, ශ්වාන, වෘෂභ, ඛර, ගජ හා කාක වශයෙන් ආය වර්ග අටක් පිළිබඳ ව සඳහන් වේ. එම අටෙන් 1, 3, 5, 7 යන ආයයන් පමණක් මිනිස් වාසය සඳහා සුදුසු වේ. ක්ෂේත්‍ර ඵලය හෙවත් ගෘහයෙහි දිග හා පළල වැඩි කිරීමෙන් ලැබෙන ඵෙක්‍යය 9න් ගුණ කර 8න් බෙදූ විට ලැබෙන ශේෂය අනුව යථෝක්ත ආය වර්ගීකරණය කරනු ලැබේ.

මේ අනුව මිනිස් වාසය සඳහා අත්‍යෝචිත වනුයේ ඔත්තේ සංඛ්‍යාවන්ට අයත් ආයයන් වේ. නූතනයෙහි ද ගෘහයක දිග හා පළල ඔත්තේ සංඛ්‍යාවලින් ගණනය කරනු ලබන්නේ යථෝක්ත සංස්කෘත වාස්තුවිද්‍යා සිද්ධාන්තයෙහි බලපෑම නිසා ය.

නූතන ගෘහනිර්මාණ සැලසුම්කරණය තුළ සාවද්‍ය වූ සිද්ධාන්ත ද බහුල ව භාවිත වේ. වර්තමානයෙහි වාස්තුවේදීන් ලෙස කටයුතු කරනු ලබන බොහෝ දෙනෙකු සතුවන්නේ පාරම්පරික ඥානයකි. වාස්තුවිද්‍යාත්මක වූ සිද්ධාන්තයන් නිවැරදි ව විග්‍රහ වන මූලාශ්‍රයන් පිළිබඳ අවබෝධයක් ඔවුනට නැත. ඔවුන්ගේ උපදේශ බොහෝමයක් සාවද්‍යාකල්පයන්ගෙන් පිරී ඇත. මේ නිසා ඔවුන්ගේ සාවද්‍ය නිර්දේශයන්ට අනුව තනනු ලබන ගෘහය ද වාස්තුදෝෂයන්ට ගොදුරු වේ.

මීට අමතර ව නූතනයෙහි ගෘහනිර්මාණ ශිල්පියා සේ ම ගෘහප්‍රධානියා ද වාස්තුවිද්‍යාත්මක වූ සිද්ධාන්තයන්ට වඩා ගෘහාලංකරණයට ම ප්‍රමුඛස්ථානයක් ලබා දෙනු පෙනේ. ගෘහාභ්‍යන්තරය තුළ දියඇලි තැනීම හා ගෙවත්ත පොකුණු, මඩුවලින් සැරසීම නූතනයෙහි සිදු කරනු ලබන්නේ වාස්තුවිද්‍යාත්මක කරුණු සලකාගෙන නොවේ. හුදෙක් ගෘහාලංකරණය අපේක්ෂා කර ගෙන ය. එහෙත් ගෘහාභ්‍යන්තර පොකුණු, දිය ඇලි හා පිටත ගෙවුයන්, මඩු තැනීම පිත අධික අය වාසය කරන නිවාස සඳහා නිර්දේශිත ගෘහාංගයෝ වෙති.

[68] අප්පුහාමි, හර්මානිස්, වයි.ඒ., (2008). *වාස්තුවිද්‍යාව හෙවත් ගෘහනිර්මාණ ශිල්පය.* ගුණසේන සහ සමාගම. කොළඹ, 2008, 96 පිටුව.

JOURNAL OF THE FACULTY OF HUMANITIES 29

කප හෙවත් සෙම අධික පුද්ගලයන්ගේ නිවසක යථෝක්ත ගෘහාංග සැලසුම කිරීම නිසා ගෘහවාසීන් නිතර ම රෝගාබාධයන්ගෙන් පෙළීම අනිවාර්යයෙන් ම සිදු වේ. සඳළුතල තැනීම ද නූතනයෙහි ගෘහාලංකරණය උදෙසා මිස වාස්තුවිද්‍යාත්මක හේතු විමසා තනනු නොලැබේ.

ඉඩමක පාද බෙදීම, ගෘහයක පාද බෙදීම, ගෘහවේධ, ද්වාරවේධ, දොර ජනේල පිහිටවීම, බිත්ති බැඳීම, වහල නිර්මාණය, භූමිප්‍රතිග්‍රහණය, පාංශු පරීක්ෂණය, වර්ණ භාවිතය හා නිදන කාමර සැලසුම්කරණය ආදි සියලු කරුණු සඳහා නිර්දේශිත සංස්කෘත වාස්තුවිද්‍යාත්මක සිද්ධාන්ත සපුරා විද්‍යාත්මක වන බව එකිනෙක තුලනාත්මක ව ගෙන විමසීමේ දී ප්‍රත්‍යක්ෂ විය. පුරාණ සමයෙහි වාස්තු දෝෂ වශයෙන් සලකා ඇත්තේ විද්‍යාත්මක වශයෙන් සදෝෂ වූ භාවිතයන් බව පෙනේ. පුරාණ ශිල්පීන් වාස්තු දෝෂ , දෝෂ වශයෙන් ම සැලකූ අතර ඒවායෙහි සත්‍යාසත්‍යතාව විමසීමට නැඹුරු නොවීය. එහෙත් නූතනයෙහි සෑම දෙයක ම විද්‍යාත්මක හේතු විමසා නිගමනවලට පැමිණේ. මේ නිසා වාස්තුවිද්‍යාත්මක වූ සිද්ධාන්තයන් ද විද්‍යාත්මක වශයෙන් කොතරම් නිරවද්‍ය දැයි විමසීම කාලෝචිත ප්‍රයත්නයක් වේ.

පුරාණ සමයෙහි ගෘහයන් තැනීමට බිම්කඩක් වෙන් කර ගැනීම දුෂ්කර කටයුත්තක් නොවීය. එහෙත් නූතනයෙහි සුදුසු බිම්කඩක් වෙන් කර ගැනීම අතිශයින් දුෂ්කර ය. මේ නිසා පුරාණයෙහි මෙන් වාස්තුදෝෂ යැයි සලකා ඉඩම් වෙන් කිරීමේ කාර්යය නූතනයෙහි සිදු කළ නොහැකි ය. විශේෂයෙන් ඉඩමේ පාද බෙදා ප්‍රේත පාදය වශයෙන් ඉඩක් වෙන් කරන්නට තරම් අවස්ථාවක් නූතන ගෘහනිර්මාණකරුවාට නොමැත. එහෙත් නූතන ශිල්පියා ප්‍රේතපාදය වෙන්කිරීමේ පුරාණ ශිල්පියා සතු වූ විද්‍යාත්මක ඥානය මනාව පසක් කර ගෙන ඇත. ඉඩකඩ සීමාසහිත වීම නිසා ප්‍රේතපාදය වෙනුවට අන්ධ බිත්ති (Blind walls) නූතනයෙහි භාවිත වන්නේ ඒ නිසා ය. මෙලෙස සංස්කෘත මූලාශ්‍රයාගත වාස්තුවිද්‍යාත්මක සිද්ධාන්තයන්ට නූතනයෙහි විවිධ ප්‍රතිසංස්කරණ එකතු වී ඇත.

කාලානුරූපී ව එලෙස ප්‍රතිසංස්කරණ එකතු වී ඇතත්, එම ප්‍රතිසංස්කරණයන් හා සෙසු සමස්ත සිද්ධාන්තයන් ද විද්‍යාත්මක බවින් පරිපූර්ණ බව තහවුරු වී ඇත.

## 5. නිගමනය

පුරාණ ලාංකේය ගෘහනිර්මාණයන්හි ශේෂ ව ඇති නටබුන් ඔස්සේ කරන ලද පර්යේෂණ තුළින් ඒවායෙහි තාක්ෂණික ඥානය සංස්කෘත මූලාශ්‍රයාගත වාස්තුවිද්‍යා සිද්ධාන්තාශ්‍රිත ව සකස් වූවක් බව තහවුරු වේ. රජමාලිගයේ සිට ගැමි ගෙදර දක්වා අත්තිවාරමේ සිට වහල නිර්මාණය දක්වා ලාංකේය ගෘහනිර්මාණ සැලසුම්කරණය සඳහා නොමඳ ව සංස්කෘත වාස්තුශාස්ත්‍ර ඥානය භාවිත කර ඇත. විජයාවතරණයෙන් ලංකාවට සංක්‍රමණය වූ කර්මාන්තකරුවන් හා මහින්දාගමනය, දුමින්දාගමනය තුළින් පැමිණි ශිල්පශ්‍රේණි පරපුර පාදක කර ගෙන ලංකාවේ වාස්තුවිද්‍යාව මෙන් ම සෙසු ශිල්ප කර්මාන්ත ද බිහි විය. පාරම්පරික තාක්ෂණික ඥානය වශයෙන් අතීතයෙහි සිට වර්තමානය දක්වා ක්‍රමාභිවෘද්ධියට පත් ව ඇත්තේ තත් ශිල්පීය ශ්‍රේණි සතු වූ දැනුම් සම්භාරයයි. භාරතීය ශිල්පීන් යටතේ ශිල්ප පුහුණුව ලද ලාංකේය ශිල්පීහු රට අභ්‍යන්තරය තුළ ගෘහනිර්මාණ කරන්නට යොමු වූහ.

JOURNAL OF THE FACULTY OF HUMANITIES 2022

එහි දී ඔවුන් දේශීය වූ අවිධිමත් ක්‍රමශිල්ප විධිමත් ලෙස ක්‍රමාභිවෘද්ධියට පත් කර ගනු ලැබුවේ භාරතීය ශිල්පීය ඥානය උපයෝගී කර ගෙන ය. භාරතීය වාස්තුවිද්‍යාව ඇතුළු සමස්ත ශිල්පීය ඥානය ම හැදී වැඩී විකසිත ව පැවතියේ සංස්කෘත ශිල්පශාස්ත්‍ර ග්‍රන්ථ මූලාශ්‍රය කර ගෙන ය. ලාංකේය ගෘහනිර්මාණ ශිල්පියා භාරතීය ශිල්පියා තුළින් අවශෝෂණය කර ගත්තේ ද තත් මූලාශ්‍රයාගත සිද්ධාන්තයන් ම ය. මීට අමතර ව ලාංකේය ගෘහනිර්මාණ ශිල්පීන් ස්වකීය අත්පොත ලෙසට භාවිත කරන ලද්දේ පුරාණ මයිමතය නම් හෙළ වාස්තුවිද්‍යා ග්‍රන්ථයයි. මේ ග්‍රන්ථය වර්තමානයෙහි පවා ගෘහනිර්මාණ සැලසුම් ශිල්පීහු ස්වකීය අත්පොත වශයෙන් පරිශීලනය කරති. පුරාණ මයිමතය සපුරා සංස්කෘත මූලාශ්‍රයාගත වාස්තුවිද්‍යාත්මක සිද්ධාන්ත සිංහලට පරිවර්තනය කිරීමෙන් සකස් කරන ලද ග්‍රන්ථයක් වේ. ලෝකයෙහි සිදු වූ තාක්‍ෂණික දියුණුවත් සමග ගෘහනිර්මාණ සැලසුම්කරණය ද ඊට සමගාමී ව දියුණු විය. එහි දී ගෘහනිර්මාණ සඳහා භාවිත මිනිස් ශ්‍රමය යන්ත්‍ර සූත්‍ර හරහා සිදු කර ගැනීම සිදු වූ විශේෂිත ම විපරිණාමය වේ. එසේ ම ගෘහනිර්මාණ සඳහා භාවිත අමුද්‍රව්‍ය ද විශාල වශයෙන් වෙනස් විය. එහෙත් ගෘහනිර්මාණ සැලසුම්කරණය සඳහා භාවිත සිද්ධාන්තයන්හි කිසිදු වෙනසක් සිදු නොවුණි. රියන වෙනුවට අඩි, අඟල්, මීටර් ආදි වශයෙන් භාවිත පාරිභාෂික සංඥාවන්හි නම් විශාල වෙනසක් සිදු විය. එහෙත් නූතනයෙහි ද ගෘහනිර්මාණ සැලසුම්කරණය සඳහා භාවිත වන්නේ පුරාණ සමයෙහි භාවිත වූ සංස්කෘත මූලාශ්‍රයාගත වාස්තුවිද්‍යා සිද්ධාන්තයන් ම වේ. මේ විශ්ලේෂණාත්මක සාධකයන්ට අනුව පුරාණ සමයෙහි සිට නූතනය දක්වා ක්‍රමාභිවෘද්ධියට පත් ව ඇති ලාංකේය ගෘහනිර්මාණ සැලසුම්කරණය සඳහා ඍජු ව ම සංස්කෘත මූලාශ්‍රයාගත වාස්තුවිද්‍යාත්මක සිද්ධාන්තයන් බලපා ඇති බව මනාව තහවුරු වේ.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

අප්පුහාමි, හර්මානිස්, වයි.ඒ., (2008). *වාස්තුවිද්‍යාව හෙවත් ගෘහනිර්මාණ ශිල්පය.* ගුණසේන සහ සමාගම. කොළඹ.

අමරසිංහ, මාලිංග, (2009). *පුරාණ රජමාලිගා.* දයාවංශ ජයකොඩි සහ සමාගම. මරදාන.

අලගියවන්න, පුවසති, (2004). *අලගියවන්න සංස්කෘත සිංහල ශබ්දකෝෂය.* සූරිය ප්‍රකාශන. කොළඹ 10.

කෝරලෙගේ, දයාරත්න, (2006). *විද්‍යාත්මක පදනමක් මත වාස්තු ශිල්පය.* කර්තෘ ප්‍රකාශන.

දීඝනිකාය, බ්‍රහ්මජාල සූත්‍රය, බු.ජ. ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 2017.

පරණවිතාන, එස්. (1998). *සිංහලයෝ.* විසිදුනු ප්‍රකාශන.

බණ්ඩාර, චිත්‍රකාන්ත, (2009). *ඓතිහාසික අසිරිමත් පොළොන්නරුව.* ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ. මරදාන.

බුද්ධදත්ත නාහිමි, පොල්වත්තේ, (1998). *පාලි -සිංහල අකාරාදිය.* බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය. නැදිමාල.

බුද්ධදත්ත නාහිමි, පොල්වත්තේ, (1998). පාලි *-සිංහල අකාරාදිය.* බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය. නැදිමාල.

මහානාම හිමි, මහාවංසය, 1 හා 11, (1957). *සුමංගල හිමි.* බටුවන්තුඩාව පඬිතුමා (පරි.) රත්නායක මුද්‍රණාලය.

JOURNAL OF THE FACULTY OF HUMANITIES 29

වික්‍රමසිංහ, එස්. ඒ., (1962). *හෙළ කලා ඉතිහාසය*, මහනුවර එක්සත් මුද්‍රණාලය. මහනුවර.
සෙනෙවිරත්න, ඩී. ආර්., (1997). *වාස්තුරත්නාවලිය*. මොඩන් පොත් සමාගම. නුගේගොඩ.

## References

Devi, Vasudev, Gayatri, (2009). *Vāstu*. Motilal Banarshidass Publishers. Delhi.
Williams, Monior, (2005). *Sanskrit - English Dictionary*. Asian Educational Services. New Delhi.

JOURNAL OF THE FACULTY OF HUMANITIES 29